
## රජ රටම බය කරන වකුගඩු ලෙඩ

රංජනී පණ්ඩුල

වකුගඩු අමාරුවට මැටි පෙරණයකින් විසඳුමක්

මගේ දැන් වයස අවුරුදු 76 කි. මගේ අම්මා අපට බීමට ගෙනාවේ වැවේ මඩ වතුරය. දොරවෙරුව වැවේ එක පැත්තක ගව මංකඩය. මීහරක් වැවට දක්කන්නේ මේ මංකඩෙනි. මීහරක් නිසා නිතර වැවේ වතුර බොර වෙයි. වැවේ අනෙක් කෙළවරෙ\ රදා මංකඩය. එතැන සේදෙන්නේ කිළිටි රෙදි ය. ගමේ රෝග ඇති විවිධ අයත්, ගමේ අයත් නාගන්නේ නාන මංකඩෙනි. ඔය අතර දිය මංකඩක් ද වෙයි. අපේ අම්මා මෙන්ම ගමේ කොයි කවුරුත් බීමට වතුර කළ පුරවා ගන්නේ දිය මංකඩෙනි. ඒ සියල්ල මැටි කළය. මැටි කළ වලට පුරවා ගන්නේ වැවේ අපිරිසිදු බොර වතුරය. මේ වතුර ගෙදර ගෙන ගිය ගමන් අම්මා වතුර කළයට ඉඟිණි ඇට තුන හතරක් දමා වතුර කළය කුරුටු ගෑ පොල් කටුවකින් වසා තබයි. පසුදා උදය වන විට මඩ වතුර පැහැදිලි, පිරිසිදු වතුරක් බවට පත් වී ඇත. ගෙදර කවුරුත් බීමට ගන්නේ ඒ වතුරය. අපේ පවුලේ කිසිවෙකුට වකුගඩු ආබාධය හැදුනේ නැත. අපේ ගමේ අයට ද වකුගඩු ආබාධය හැදුනේ නැත. මේ විශ්වකර\ම ඉඟිණි ඇටය කළේ කුමක්ද? ජලය පිරිසිදු කිරීමයි. කිවුල් ජලය, බොර ජලය, ලුණු මිශ්‍ර ජලය මේ ආදී අපවිත්‍ර ජලය පිරිසිදු කිරීමේ ස්වාභාවික බලයක් ඉඟිණි ඇටයට ඇති බව අත්දැකීමෙන් මම තේරුම් ගතිමි. ඉඟිණි ඇටයේ ඇති හාස්කම ගැන සිංහල වෙද පරම්පරාව හොඳින් දනී. වකුගඩු රෝගය හැදෙන්නේ ජලය නිසා නම්, ජලය පවිත්‍ර කිරීමට ස්වාභාවික ඉඟිනි ඇටය යොදා ගැනීමට උනන්දු නොවන්නේ ඇයි? මේ පිළිබඳව සිංහල වෛද්‍යවරුන්ගේ ද දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේද විශේෂ අවධානය යොමු විය යුතුව ඇත.

දිවයිනේ බොහෝ ප්‍රදේශවලට වඩා රජරට භූගත ජලය ලුණු රසයෙන්ද, කිවුලෙන්ද, ෆ්ලෝරයිඩ් වැනි රසායනිකයන්ගෙන් ද යුක්තය. එප්පාවල වැනි භූගතව පොස්පේට් පවත්නා ප්‍රදේශවල ජලයේ රසායනිකයන් වැඩිය. තලාව ප්‍රදේශයේ භූගත ජලය තද ලුණු රසයෙන් යුක්තය. රජරට අපේ මුතුන් මිත්තන් භූගත ජලයට වඩා වැව් ජලය පරිහරණයට ගත්තේ එනිසා විය හැකිය. නමුත් දැන් වැව් වල ජලය භූගත ජලයටත් වඩා අපද්‍රව්‍යවලින් ඉඳුල් වී තිබේ. විශේෂයෙන් ආනයනික ටී.එස්.පී. පොහොරවල සහ අනිකුත් රසායනික පොහොරවල කැඩ්මියම් : ආසනික් වැනි විෂ කාරක බැරලෝහයන් අඩංගුව පවතී. මේවා ජීර\ණය වන්නේ නැත. මෙම විෂ කාරකයන් ජලය සමඟ ද ආහාර බෝග සමගද එකතු වී ශරීරගත වීමෙන් ශරීරයේ තැන්පත් වෙයි. කෘමිනාශක හා වල් නාශකවල අඩංගු විෂකාරකයන්ද ජලය සමග මිශ්‍ර වී ශරීරගත වෙයි. පදවිය වැනි පුරාණ ජනපදවල කාලයක් තිස්සේ මෙම කෘෂි රසායනිකයන් ගොවිතැනට භාවිත කරන නිසා එබඳු ප්‍රදේශවල ජලය අපවිත්‍රවීම් වැඩිය. මේ අතර ජලය රැස්කර තබා ගැනීමට සහ ආහාරපාන පිසීමට ඇලුමිනියම්

භාණ්ඩ පරිහරණය කිරීමෙන් ද, ජලය අපවිත්‍ර වේ. මේ අන්දමට භූ ගර\භයේදී ද : මතුපිට පරිහරණයේදී ද ජලය අපවිත්‍ර වීමේ හේතුවෙන් සහ එම අපවිත්‍ර ජලය පාවිච්චි කිරීමෙන් වකුගඩු රෝගය වැළඳෙන බවට මතයක් ගොඩනැගී තිබේ. එසේ නම් මේ අපවිත්‍ර ජලය පිරිසිදු කර ගැනීම සඳහා ඉඟිණිඇට භාවිතයට ජනතාව පෙළඹවීම ගැන උනන්දුවීම කාලෝචිතය. ඇලුමිනියම් භාණ්ඩ භාවිතය ජලය අපිරිසිදු වීමට හේතුවක් ලෙස සලකා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් වකුගඩු රෝග ග්‍රහස්ථ ප්‍රදේශවල පවුල්වලට මැටි වළං කට්ටල බෙදාදීමේ වැඩපිළිවෙළක් ද දැන් ක්‍රියාත්මක කර තිබේ. ඇලුමිනියම් භාජනවලට විකල්පයක් වශයෙන් මැටි වළං හුරු කරන්නාක් මෙන් රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික පොහොර භාවිතයට ගොවි ජනතාව දිරි ගන්වන්නේ නම් ජලය අපිරිසිදු වන තවත් අපද්‍රව්‍ය ගණනාවක් ජලයෙන් ඉවත් කිරීමට පුළුවන.

මෙම අපද්‍රව්‍යවලින් කෘෂිකාර\මික ජලය මොන තරම් අපවිත්‍ර වී තිබේද යත් මේ වන විට වෙල්පතු වතුරෙන් පිරෙන රාජාංගණ ජලාශයේ ජලය බීමට නුසුදුසු බවට නිර\දේශ කර තිබේ.

යූරියා

පොහොර වැනි විෂ කාරකයන් යොදා ගම්බද පෙදෙස්වල පෙරන මත්පැන් වර\ග නිතර භාවිත කිරීම ද වකුගඩු රෝගය සෑදීමට තවත් එක් හේතුවක් බව හඳුනාගෙන තිබේ. පදවිය ආශ්‍රිත ගම්බද ප්‍රදේශවල මෙම විෂ මත්පැන් වර\ග සුලභය. විශේෂයෙන් දිළිඳු ගොවි ජනතාව පරිසරයේ පවත්නා මෙවැනි විෂ මත්පැන්වලට ඇබ්බැහි වීමෙන් වකුගඩු රෝගයට බිලිවන අවස්ථා ඇති වී තිබෙන බව පර\යේෂණ මගින් හඳුනාගෙන ඇත.

බටහිර වෙදකමෙන් වකුගඩු රෝගය සුව නොකළ හැකි බව තහවුරු වී තිබේ. එම රෝගය සුව කළ හැකි බෙහෙත් බටහිර වෛද්‍ය ක්‍රමයේ නැත. එම වෙදකමින් කරන්නේ රෝගය යම් කලකට පාලනය කිරීම පමණි. අද පවත්නා ප්‍රතිකාර විධි අනුව වකුගඩු රෝගය වැළඳුන රෝගියකු එම රෝගය නිසාම ඒකාන්තයෙන්ම මරණයට පත්වේ. බටහිර බෙහෙත් ගැනීමෙන් සිදුවන එකම සහනය වන්නේ රෝගය පාලනය කරමින් මරණය කල් දමා ගැනීම පමණි. දැන් පවත්නා ක්‍රම අනුව වකුගඩු රෝගියකු යථා තත්ත්වයට ගෙන ඒමට නම් ඔහුගේ රෝගී වූ වකුගඩු ඉවත් කොට අලුත් වකුගඩු බද්ධ කළ යුතුය. මේ තත්ත්වය නිසාම ඉඟිණිඇට ඖෂධය ගැන දේශීය වෛද්‍යවරුන්ගේ දැඩි අවධානය යොමු විය යුතුව තිබේ. මක් නිසාද? හැම රෝගියකුටම වකුගඩු බද්ධ කිරීම නොකළ හැකි නිසා ය.

මහනුවර මහ රෝහලේ වකුගඩු රෝග විශේෂඥ වෛද්‍ය තිලක් අබේසේකර මහතාගේ මුල් වීමෙන් එම වකුගඩු රෝග පදනම හරහා අනුරාධපුර මහ රෝහලට යාව වකුගඩු රෝගයටම අදාළ දැවැන්ත රෝහල් ගොඩනැගිල්ලක් ඉදිකර, වකුගඩු රෝගයටම අදාළ ප්‍රතිකාර හා පර\යේෂණ කරගෙන යයි. මීට අමතරව මැදවච්චියේ සහ පදවියේ වකුගඩු රෝග සායන මධ්‍යස්ථාන පිහිටුවා තිබේ. මෙවායේදී රෝගීන් හඳුනාගෙන, ඔවුන්ට ප්‍රතිකාර කරන අතරම යම් පමණකට පර\යේෂණ කටයුතු ද කරගෙන යයි. මුලින් ද සඳහන් කළ පරිදි බටහිර වෙදකමින් වකුගඩු රෝගය යම් පමණකට පාලනය කරනවා මිස, සැබවින්ම නිට්ටාවට සුව කිරීමක් සිදු වන්නේ නැත. එසේ කෙරෙන්නේ වකුගඩු බද්ධ කිරීමෙන් පමණි. අද සිටින රෝගී ගහනය අනුව වකුගඩු බද්ධ කිරීමෙන් පමණක් මේ ගැටලුව විසඳීමට නුපුළුවන. මේ සඳහා අනිවාර\යයෙන්ම රෝග නිවාරණ ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය වේ. එසේ

නොකිරීමෙන් දිගින් දිගටම සිදුවන්නේ බටහිර බෙහෙත් වෙළෙඳාමක් පමණි. ජීවිත අනතුර වැළකී යන්නේ නැත. බටහිර බෙහෙත් වෙළෙඳාමට වඩා වැදගත් වන්නේ වකුගඩු මාරක රෝගයෙන් අපේ ජනතාව බේරා ගැනීමය. මේ නිසා දේශීය වෙදකමෙන් වේවා, බටහිර වෙදකමෙන් වේවා, අප වහ වහා යා යුත්තේ වකුගඩු රෝගය නිවාරණය කිරීමේ පැත්තටය..

පදවිය : පරාක්‍රමපුර : ශ්‍රීපුර : වැලිඔය : සිංහපුර : ඇතාවැටුණුවැව : චෛතියගිරිය වැනි ප්‍රත්‍යන්ත ප්‍රදේශවල අද වන විට වකුගඩු රෝගය බිහිසුණු ලෙස පැතිරී තිබේ. මේ ප්‍රදේශයේ ජනතාවගේ ඉටු දෙවියා මෙන් නිතර දෙවේලේ ජනතාව හා බැඳී කටයුතු කරන ශ්‍රීපුර ධර\මාලෝක පරිවේණාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත කරන්බන්කුලමේ සිරිධම්ම හිමියෝ ප්‍රදේශයේ වකුගඩු රෝගය ගැන මෙසේ කියති.

වසංගතයකට බිළිගත්තාක් මෙන් මේ ප්‍රදේශය පුරා වකුගඩු රෝගය පැතිරිලා. වකුගඩු රෝගියකු නැති ගෙදරක් හොයාගන්න බැරි තරම්. එක ගෙදර දෙතුන් දෙනා වකුගඩු රෝගීන් සිටින අවස්ථා තියෙනවා. අවුරුද්දෙන් අවුරුද්දම රෝගීන් වැඩිවෙනවා. අවුරුද්දෙන් අවුරුද්දම රෝගයෙන් මියයන සංඛ්‍යාව වැඩිවෙනවා. හැම ගෙදරකම නැතත් ගෙවල් තුන හතරකට එක්කෙනෙක් වකුගඩු රෝගයෙන් මැරිලා. මෙය මරණීය රෝගයක්. වසංගතයක්. තාමත් මෙහි බැරෑරුම්කම වගකිව යුත්තන් තේරුම්ගත් බවක් පෙනෙන්නට නෑ.

ශ්‍රීපුර

වගේ ප්‍රදේශ අයිති ත්‍රිකුණාමලයට. ත්‍රිකුණාමලයේ පාලකයන්ට මේ ගැන ඇඟට දැනෙන්නේ නෑ. සමහරදාට ශ්‍රීපුර රෝහලේ වකුගඩු බෙත් පෙති නෑ. එහෙම වුණාම රෝගීන්ට බෙත් පෙති මිලදී ගැනීමට සිදුවෙනවා. බෙත් පෙත්තක් රුපියල් තිහයි. හතළිහයි. හැම දිනකම පෙත්තක් ගන්න ඕන. ඒ පෙත්තෙන් කරන්නේ රෝගය සුව කිරීම නෙමෙයි, පාලනය කිරීමයි. පදවිය පැත්ත පාලනය වෙන්නේ අනුරාධපුරයෙන්. ඒ පැත්තෙ අයට පදවිය රෝහලෙන් බෙත් ලැබෙනවා. රෝගීන්ට රුපියල් පන්සීයක මාසික ආධාරයකුත් ලැබෙනවා. ඒත් ශ්‍රීපුර පැත්තේ බොහෝ රෝගීන්ට ඒ ආධාරය ලැබෙන්නෙ නෑ. ආධාරය නෙමෙයි වැදගත්. වකුගඩු රෝගයෙන් ජීවිත බේරා ගැනීමේ නිවාරණ වැඩපිළිවෙළක්. තාමත් එහෙම වැඩපිළිවෙළක් පේනතෙක් මානෙක නෑ. කිකිළිය කෙකර ගගා ඉන්නවා වගේ බලධාරිනුත් කෙකර ගගා ඉන්නවා. ප්‍රායෝගික වැඩක් කෙරෙන්නේ නෑ.

ජපානයේ එක් අවස්ථාවක : එක් ප්‍රදේශයක වසූරිය වසංගතයක් මෙන් පැතුරුණා. සෞඛ්‍ය බලධාරීන් මොකද කළේ? ඒ ප්‍රදේශයේ හදිසි නීතිය පණගන්වලා.... වෛද්‍යවරු.... හෙදියන්..... තාක්‍ෂණික ශිල්පීන් ගමින් ගමට ගොස් කඳවුරු බැඳ ගත්තා. මේ සෞඛ්‍ය සේවා බළකාය

ගෙවල් මණ්ඩි

බෙදාගත්තා. ඉන් පසු ගෙන් ගෙට යමින්, වත් පිළිවෙත් පුරුදු කරමින් දිනපතා බෙත් දුන්නා.

රෝගීන්ට මොන තරම් අස්වැසිල්ලක්ද? මානසික ශක්තියක් ද? සති දෙක තුන යන විට වසංගතය ඉවරයි. දැන් මේ ප්‍රදේශයේ වකුගඩු රෝගය බහුල ලෙස ව්‍යාප්ත වෙලා අවුරුදු හත අටකට වැඩියි. කෝ ඉතින් ඒවගේ ජාතික වැඩසටහනක්. ඡන්දෙ කාලෙට ඇවිදින් ජීවත්ව ඉන්න අයගෙ ඡන්ද ටික

බොරු බෙගල් අතැරල හුරගෙන යනවා. ඊට පස්සෙ ඇහැ ඇරලා බලන්නෙ නෑ. ඒ අයට පදවිය : ශ්‍රී පුර මතක් වෙන්නෙ ඡන්ද කාලෙට ඡන්දෙ ගොඩ ලොකු කර ගන්න විතරයි.

ශ්‍රී පුර නුගරුක්ගම රාජනී පණ්ඩුල කාන්තාව දරුවන් තිදෙනකුගේ මවක්. ඇය දැන් වසර හයක පමණ කාලයක සිට වකුගඩු රෝගයට ගොරු වෙලා. ඇයගේ අඳෝනාව මෙහෙමයි.

ඊයේ පෙරෙ\ දා මගේ ලේ පරීකෂා කළා. ලේ වාර\තාව අනුව මගේ ලේ වල දැන් ජීව ශක්තිය තියෙන්නේ 20% ක් පමණයි. 80% ක් ම ලේ අප්‍රාණික වෙලා. මේ අනුව දැන් මම ඉන්නේ මරණය පෙනෙන තෙක් මානයේ. මගේ සැමියා රෝගියෙක්. මමත් දැන් මරු කටට ළංවෙලා. ඉතින් මගේ දරුවන්ට යන කල දවස ගැන හිතන කොට මගේ පපුව වාවන්නෙ නෑ. හැමදාම බෙත් පෙත්තක් ගන්නවා. රෝහලේ බෙහෙත් නැති වුණාම ෆාමසියෙන් ගන්නවා. බෙත් පෙත්තක් රුපියල් 40 යි. මාසෙකට බෙත්වලට රුපියල් 1200 ක් ඕන. මම ජීවත්වන්නෙ අතුරක. කොයි වෙලාවෙ අතුරෙන් පල්ලට වැටෙයිද දන්නෙ නෑ. මේ හැම ගමකට වකුගඩු රෝගීන් විස්ස විසිපහ ඉන්නවා. උතුරු මැද පළාතට අලුතෙන් පත්ව සිටින සෞඛ්‍ය ඇමැතිවරයා දැනුම තේරුම ඇති ප්‍රදේශයේ උගත් කෙනෙක්. ඇමැති පුටුවේ වාඩිවෙන විටම ඔහුට දැනුනෙ වකුගඩු රෝගයේ රස්නය. ඔහු නමින් පේශල ජයරත්න බණ්ඩාර. නව ඇමැතිවරයා මේ ගැන දැක්වුයේ දිරිගන්වන සුළු අදහසක්.

උතුරු මැද පළාතේ මට තියෙන ලොකුම අභියෝගය වකුගඩු රෝගයයි. මේ මගේ ජනතාව මොන උපාය මාර\ගයෙන් හරි මේ ගොඩ දාන්න ඕන. මේ මානව අවශ්‍යතාව මගේ ඇඟට ගන්නවා. රෝගයේ පර\යේෂණ කටයුතු පුළුල් කරමින්, ඒ අනුව නිවාරණ කටයුතු ආරම්භ කරනවා. උතුරු මැද සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබෙන වාර\ෂික මුදලින් වැඩිම කොටසක් වැය කරන්නේ වකුගඩු ප්‍රශ්නයට. මේ පිළිබඳව පුළුල් සමීකෂණයක් කිරීමට දැනටම කටයුතු ආරම්භ කරලා.

දේශීය වෛද්‍ය ඇමැති තිස්ස කරල්ලියද්ද මහතා වකුගඩු රෝගීන් සුලභ ප්‍රදේශයේ උපන් කෙනෙක්. ඒ මහතා මෙසේ අදහස් දැක්වීය.

මේක මගේ ගම. මගේ ඡන්ද කොට්ඨාසය. මගේ ඡන්දදායකයො. වකුගඩු ප්‍රශ්නය මගේ ඇඟට වැදිලා. ඇලුමිනියම් භාවිතය එක හේතුවක්. ඒ නිසා ජනතාව මැටි වළං වලට හුරු කරන්න නොමිලයේ හැම පවුලකටම මැටි වළං කට්ටල බෙදල දෙනවා. වකුගඩු රෝගය වෙනුවෙන් ම මැදවච්චියේ සහ පදවියේ අංග සම්පූර\ණ සායන මධ්‍යස්ථාන ඇති කරල තියෙනවා. මීට අමතරව මේ පිළිබඳව පර\යේෂණ කරන්න දේශීය වෛද්‍යවරු කණ්ඩායමක් යොදවලා තියෙනවා. නාවින්න ආයුර\වේද පර\යේෂණායතනයේ මේ ගැන දිගටම පර\යේෂණ කරගෙන යනවා.

ඉඟිණි ඇට සාධකය ගැනත් පර\යේෂණ කරනවා. දැනට හඳුනාගෙන ඇති පරිදි ඇලුමිනියම් භාණ්ඩ භාවිතය, කෘමි නාශක, වල් නාශක, රසායනික පොහොර භාවිතය, අපවිත්‍ර ජලය, විෂ මත්පැන් භාවිතය වැනි කරුණු මේ රෝගය වැළඳීමට බලපානවා. මේ නිසා වකුගඩු රෝගය නිවාරණය කරන්න නම් අපට ජනතාවගේ පුළුල් සහයෝගයක් සහ කැපවීමක් අවශ්‍යයි.

රත්න බී. ඒකනායක